බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2566
දුරුතු මස 06 වන සෙනසුරාදා

බෞද්ධාලෝකය

වන්දනාමාන කිරීමේ ආගමික චාරිත්‍ර

බෞද්ධයන් විසින් බුදුරජාණන් වහන්සේ අමතා අයැදීමක් යාඥාවක් කරනු නොලැබේ.එසේ වුවද වන්දනාමාන කරන උත්සවයන්හිදී බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ විසින් දේශනා කරනු ලැබූ ධර්මය සහ උන් වහන්සේගෙන් පසු එම ඉගැන්වීම් අනුව යමින් උතුම් මහණදම් පිරීමට අවතීර්ණ වූ මහා සංඝයා වහන්සේලාගේ සද්ගුණ මහත්සේ පසසන ගාථා කියමින් වන්දනා කරනු ලැබේ.

මේම ක්‍රියාදාමයන්ගේ අරමුණ වන්නේ ගෞරවය ලැබීමට සුදුසු අය වෙත ගෞරව කිරීම සහ ඊට අමතරව දැඩි බැතිමතුන් ගේ අපේක්ෂා උත්තේජනය කිරීම මෙන්ම තමන් ද එවැනිම ගුණාත්මක භාවයන් වැඩි දියුණු කර ගැනීමේ මල් පහන් සුවද දුම් අදිය පූජා කිරීමෙන් සංකේතාත්මකව ප්‍රතිචාර දැක්වීමක් සහ කෘතඥතාව පළකිරීමක් වේ.

බුද්ධාගම හුදු ආගමක් ම පමණක් නොවේ.වසර දහස් ගනනක ඓතිහාසික පසුබිමක් මෙන්ම ඊටම ආවේණික දර්ශනවාදයක්, සාහිත්‍යයක් සහ කලා ශිල්ප ද ආර්ථික දේශපාලනික හා සමාජීය සදාචාරාත්මක ආයතන හා ආචාර ධර්ම පද්ධතියක් ද ඇති පූර්ණ ශිෂ්ඨාචාරයක් ද වේ

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් මාසිකව සෑම පුර පසළොස්වක පොහෝ දිනකම පලකරනු ලබන බෞද්ධාලෝකය ඊ-පුවත්පත සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.නිර්මාණ ඉදිරිපත් කිරීමට කැමැත්තේ නම්, එම නිර්මාණ පහත සඳහන් ලිපිනයට ලියා එවීම හෝ විද්‍යුත් ලිපිනය ඔස්සේ එවීමට කටයුතු කළ හැක (පිටු දෙකක ප්‍රමාණයට සෑහෙන තරම්) සෑම කලාපයක්ම www.acbc.lk අප වෙබ් අඩවියෙන් නිකුත් කරන අතර මීට පෙර නිකුත් කරන ලද මාසික ඊ-පුවත්පත් අප වෙබ් අඩවියෙන් පරිශීලනය කළ හැක

බෞද්ධාලෝකය

උපදේශක මණ්ඩලය
මහාචාර්ය නිමල් ද සිල්වා
මහාචාර්ය මාලිනී ඇඳගම
මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ

සංස්කරන කළමණාකරනය
ඉෂාන් බුද්ධික එදිරිසූරිය

සංස්කාරක මණ්ඩලය
නාලක ජයසේන
ශ්‍යාම් නුවන් ගනේවත්ත

පිටු සැකැස්ම
කාවින්ද දිල්ෂාන්
ක්‍රිෂාන්ති දිසානායක

ප්‍රකාශනය
බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දුරකථනය (011 2691659 / 011 2665047)
ෆැක්ස් (011 2665047)
web : www.acbc.lk
E-mail : buddhistinfo380@gmail.com

ශ්‍රී ලාංකේය සංස්කෘතිය සුරකිමු.

ශ්‍රී ලංකාව යනු ශත වර්ෂ 22 කට වැඩි දීර්ඝ ඉතිහාසයක් ඇති නිර්මළ බුදු සසුන සුරකි ජනතාවක් සිටින, කුඩා දූපතකි. බුදු දහම පහළ වූයේ දඹදිව වුවත් එය ආරක්ෂා කරගැනීම, ඉන්දියානුවන්ට නොහැකි විය. එහෙත් ශ්‍රී ලාංකිකයෝ පිවිත පරිත්‍යාග කරමින් බුදුසසුනත් බෞද්ධ සංස්කෘතියත් ආරක්ෂා කළහ. එක ම ජාතියක් විසින් එක ම සංස්කෘතියක් ශත වර්ෂ 22 ක් පමණ, දීර්ඝ කාලයක්, තුළ සුරැකීම ඓතිහාසික වශයෙන් අගය කළ යුත්තකි. එය ලෝකයේ බොහෝ ජාතීන්ට කළ නොහැකි වූ කාර්යභාරයකි. බෞද්ධ සංස්කෘතියේ ඓතිහාසික වැදගත්කම සනාථ කිරීමට ශිලාලිපි, පුරාවස්තු, ඓතිහාසික ලේඛන, වංශ කථා හා සාහිත්‍ය ග්‍රන්ථ, ජනප්‍රවාද දහස් ගණන් ඇත. එයට වඩාත් ප්‍රබල සජීවී සාධකය වන්නේ, එම සංස්කෘතිය යාවත් කාලීන කෙරෙන ජනතාවක් ලක්දිව ජීවත් වීමයි.

බුදු දහමින් පෝෂිත ශ්‍රී ලාංකේය සංස්කෘතිය ආරක්ෂා කළ යුත්තේ ඇයි?

ලාංකික සංස්කෘතිය පෝෂණය වී ඇත්තේ බුදුදහමේ මූලික ඉගැන්වීම්වලට අනුකූලවය. එය සංකේතවත් කෙරෙන්නේ වැවයි දාගැබයි, ගමයි පන්සලයි යනුවෙනි. වැවෙන් ආර්ථික දියුණුවත් දාගැබෙන් ආධ්‍යාත්මික සංවර්ධනයත් අර්ථවත් කෙරේ. බුදු දහමින්, සංවර්ධනය යනුවෙන් අර්ථවත් කෙරෙන්නේ, ආර්ථික සංවර්ධනය සමග ම ආධ්‍යාත්මික ගුණවගාවත් සමතුළිත වියයුතු බවයි. එය ද්විචක්‍රු හෙවත් ඇස් දෙකින් ම බලා කටයුතු කිරීමට මාර්ගෝපදේශයකි. එවැනි ජීවන දර්ශනයක් ඇති ලාංකිකයන්ගේ දිවි පැවැත්ම සකස්වී ඇත්තේ පඤ්ච නියාම ධර්මවලට අනුකූලය. බීජ නියාමය, උතු නියාමය, චිත්ත නියාමය, ධම්ම නියාමය, කම්ම නියාමය යන සම්මතවලට අනුව ක්‍රියා කරන මිනිසාගේ දියුණුව ථිරසාරය.

එවැනි මිනිසුන් සිටින සමාජයක ජනතාව සතුටින් ජීවත් වන්නෝ වෙති. ඔව්හු තමාගේ අභිවෘද්ධිය මෙන්ම අන්‍යයන්ගේ දියුණුවත් අපෙක්ෂා කරති. කිසිවෙකුටත් හිංසාවක් නොකරති. ධන කාමයෙන් හෝ බලකාමයෙන් උමතු වූවෝ නොවෙති. (සබ්බභූත හිතානුකම්පි හෝ..... උභය බයාබාධාය සංවත්තති.) ධාර්මික ජීවිතයකට කැමැති ලාංකිකයා බීජනියාමය හෝ උතු නියාමය ඉක්මවා කටයුතු නොකරයි. එනිසා වැඩි ඵලදාවක් අපේක්ෂාවෙන් මහ පොළොවට කෘමිනාශක එක් කරන්නේ නැත. මහ පොළොව, ජලය, වාතය, ඇළදොළ, ගස්කොළන් සහ කෘමීන් ඇතුළු සියලු සතුන් ආරක්ෂා කිරීම, තමාගේ වගකීමක් සේ ලක් වැසියෝ සිතූහ. එනිසා ඔවුහු පරිසර දූෂණයක් හෝ සම්පත් විනාශයක් නොකළහ.

බීජ නියාමය ඉක්මවන ජානවිකෘති කිරීමක් හෝ උතු නියාමය ඉක්මවන පරිසර දූෂණයක් හෝ නොකර තමාගේ අවශ්‍යතා සපුරා ගත් ලාංකිකයෝ සතුටින් ජීවත් වූහ. මෙසේ තමාගේ ජීවන අවශ්‍යතා සපුරාගත් ඔවුහු, අත්ථි සුඛය, භෝග සුඛය, අණන සුඛය, අනවජ්ජ සුඛය ලැබූහ. තමාටත් තම දරුපවුලටත් සමාජයටත් යුතුකම් ඉටුකිරීමට ප්‍රමාණවත් ධනයක් උපයා ගැනැනීමෙන් තෘප්තිමත් වූ බෞද්ධයා, අත්ථි සුඛයෙන් යුත්තය. මහේච්ඡතාවෙන් තොර වූවෙකි. අල්පේච්ඡතාවෙන් ද යුක්ත වූ ඔහු, යථා ලාභ, යථා බල, යථා සාරුප්ප ගුණයෙන් පිරිපුන් වේ. එවැනි චින්තනයකින් පිරිපුන් මිනිසුන්ගෙන් යුක්ත සමාජයක්, අසීමිත ආසා වලින් පිරුණු පරිභෝජනවාදී ධන තෘෂ්ණාවෙන් හා තරඟයෙන් වෙලාගත් එකක් නොවේ. මෙවැනි ජීවන දර්ශනයක් ඇති සමාජයක, ජනගහනය වර්ධනය වුවත් සීමිත සම්පත් වලට එතරම් අභියෝගයක් නොවේ. එනිසා මෙහි අන්තරගත ආර්ථික මූල ධර්ම න්‍යාය වලින්, ස්ථිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා බෝහෝ දේ උගත හැකිය. මහී කාන්තාවගේ දරුවන් පෝෂණය කිරීමේ හැකියාව මිහිකතට ඇතත් ඇගේ දරුවන්ගේ අසීමිත ආශාවන් සම්පූර්ණ කිරීමට ඇයට නොහැකිය. (ඌණෝ ලෝකෝ අතිත්තෝ තණ්හා දාසෝ...) මිනිසුන් තුළ ඇත්තේ අසීමිත ආසාවන්ය.

කම්ම නියාමයත්, චිත්ත නියාමයත්, ධම්ම නියාමයත් පිළිගත් ලාංකිකයෝ පව් කිරීමට බිය වෙති. වැරදි කිරීමට ලැජ්ජා වෙති. පස්පව් නොකරති. එනිසා ඔවුන් තුළ ස්වයං විනයක් තිබුණි. එය සමස්ථ සමාජයේ ආරක්ෂාවටත් පැවැත්සටත් ථිරසාර බලයක් විය. එය නීතියෙන් හෙවත් බලය යොදා මිනිසා හික්මවනවාට වඩා ථිරසාර වන්නේ, අවබෝධයෙන් යුක්තව ස්වයං විනයෙන් සිදුවෙන්නක් නිසයි.

නීතියෙන් හෝ බලයෙන් කෙරෙන සංවරය තාවකාලිකය. එය මර්දනයකි. අවස්ථාව, පරිසරය, හැකියාව ලැබුණොත් මිනිසා වරදට පෙළඹේ. එහෙත් කම්ම නියාමයත් චිත්ත නියාමයත් ධම්ම නියාමයත් පිළිගන්නා බෞද්ධයා, වැරදි කිරීමෙන් වළකින්නේ, වැරදි හෙවත් පවු කිරීමෙන් අපාගත වී දුක්විඳීමට බියෙනි. එය ස්වයං විනයකි. එවැනි අවබෝධයෙන් කෙරෙන දමනයක් නිසා ඇතිවෙන සංවර්ධනය ථිරසාරය. එනිසා ථිරසාර සංවර්ධනයකට අවශ්‍ය ආර්ථික සහ ආධ්‍යාත්මික මූලධර්ම, ලාංකික බෞද්ධ සංස්කෘතික ඉතිහාස කථාවේත් ග්‍රාමීය ජනතාවගේ ජීවිත කථාවලත් අන්තර්ගත වේ.

වර්තමානයේ විවිධ බලපෑම් නිසා ලාංකික ජනජීවිතය වෙනස් වෙමින් පවතී. තාක්ෂණ දියුණුවෙන් හා වාණිජ සංස්කෘතියෙන් මුළු ලෝකය ම වෙලාගෙන සිටී. ආත්මාර්ථකාමීත්වය සහ තරඟය විසින් සමස්ත සමාජය ම ගිලගෙන ඇත. එනිසා නොයෙක් රටවල පැවති වටිනා සංස්කෘති හා ස්වාභාවික සම්පත් විනාශ වෙමින් තිබේ.

ලාකික සංස්කෘතියත් මුණපා ඇත්තේ එවැනි භයානක අනතුරකටය. එ නිසා මෙයින් ගැලවීමට සියලු ම ලාංකිකයන් විමසිලිමත් විය යුතුය.

01. බීජ නියාමයත් උතු නියාමයත් නොකඩා මිනිසාගේ අවශ්‍යතා සපුරා ගන්නේ කෙසේද?

02. පඤ්ච සීලය නොකඩා කර්මාන්ත සංවර්ධනය කරන්නේ කෙසේද? උදාහරණයක් වශයෙන්, මත්ස්‍යවගාව, මත්ස්‍ය සම්පත ආදී වචන භාවිත කරමින් මසුන් මැරීම වැනි මිච්ඡා ආජීවයට අයත් රැකියා වලට ජනතාව ඇදමීම රජයක් විසින් නොකළ යුතුය.

03. ධනෝපායන මාර්ග වශයෙන් සුරාව, සූදුව වැනි මිච්ඡා ආජීවයට අයත් රැකියාවලට ජනතාව දිරිගැන්වීම රජය විසින් නොකළ යුතුය. සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ දී වුවත්, සංචාරකයන් ඇදගනීමට යැයි කියමින් හෝ මිච්ඡා ආජීවයට අයත් ව්‍යාපාර නොකර, දේශීය සංස්කෘතිය, පෞරාණික වස්තු, ස්වභාව සෞන්දර්යය වැනි දේවල් ප්‍රයෝජනයට ගෙන සංචාරක ව්‍යාපාර ආදිය දියුණු කළ යුතුය.

04. සංවර්ධන ව්‍යාපාර වල දී ස්වාභාවික සම්පත් සුරැකීම පිළිබඳ ව විශේෂ අවධානය යොමුවිය යුතුය.

05. පටු අපේක්ෂා ඇතිව භූමිය හෝ ස්වභාවික සම්පත් විදේශවලට විකිණීම හෝ බදුදීම නොකළ යුතුය.

06. තාක්ෂණ ඥානය, විද්‍යාත්මක උපකරණ, සංස්කෘතියට බලපාන උපාංග ආදිය මෙරටට හඳුන්වා දීමේ දී බුද්ධිමත් ව හා විචාරශීලීව කළ යුතුය.

07. ථිරසාර සංවර්ධනයකට ගැලපෙන මූල ධර්ම පදනම් කරගෙන අධ්‍යාපනය සකස්විය යුතුය.

08. බෞද්ධ ජන විඤ්ඤාණය විකෘති කෙරෙන කූට ව්‍යාපාර වලට ඉඩ නොදිය යුතුය.

උදාහරණ, බෞද්ධයන්ගේ ශ්‍රද්ධාව දුර්වල කෙරෙන ආකාරයට බුද්ධ චරිතය කෙළෙසීම, සිදුහත් කුමරුන්ගේ උපත, සිදුහත් තවුසාණන් විසින් බුදු බව ලබා ගැනීම, බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය වැනි සිදුවීම් ලංකාවේ දී සිදු වූයේ යැයි කියමින් බුද්ධ චරිතය විකෘති කිරීම, මහාමායා යනු මහාමායාවක් වැනි අතාර්කික ලෙසින් බෞද්ධ වචනයලට වැරදි අර්ථ දැක්වීම් ආදී විකෘති කිරීම දැකිවිය හැකිය.

09. වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනයට සමගාමී ව යන ලෙසට විෂය ධාරා වෙනස් කිරීම නිසා භික්ෂූන් වහන්සේලාගේ දැනුම දුර්වල වී ඇත. එයට පැරණි විෂය ධාරාත් නූතන අධ්‍යාපන ක්‍රමවේදත් සංයුක්ත කරමින් අනාගත අභියෝග වලට මුහුණ දිය හැකි ගුණ නුවණින් පිරිපුන් භික්ෂුවක් නිර්මාණ කළ හැකි අධ්‍යාපනයක් බවට පිරිවෙන් විෂය ධාරා වෙනස් කළ යුතුය.

10. මෙවැනි විශේෂ කරුණු පිළිබඳ ව අවධාරණය කරමින් සියලු ක්ෂේත්‍රවලට ගැලපෙන ලෙසින් අධ්‍යාපන, ආර්ථික, සෞඛ්‍ය, මාර්ග, පරිසරය ආදිය සඳහා ථිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුය.

11. ආණ්ඩුක්‍රම පතක් සකස් කරන්නේ නම් නීති විසාරදයන්ගේ ද සියලු ජාතිකයන්ගේ ද ලාංකික සංස්කෘතියත් බෞද්ධ අනන්‍යතාවත් පිළිබඳ ව අවබෝධයක් ඇති බුද්ධිමතුන්ගේ ද සමන්විත මණ්ඩලයකින් සිදුකළ යුතුය.

මහාචාර්ය කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි.
ශ්‍රී සුමන මහපිරිවෙන,
මුද්දුව, රත්නපුර,

ඇයම විය ඇය - වෛද්‍ය ඉන්ද්‍රාණි රත්නායක

උතුරන සෙනෙහසින් බිරිඳක මවක ලෙසින්
විඳගෙන පැමිණි දුක, සුකිරි අමොද රසින්
උර දෙන බරට, බඹ විහරණ රැහෙන හිසින්
සවි බල මවගෙ තැබුවැක මහමෙරට උසින්

සිය හිත සුවය වෙත ඇති සිත තුරන් කර
ගෙවූ රෑ ගණන නිම් නැත නිදි සුවෙන් තොර
ඇස මත තබා රැක දරුවන් රජුන් කර
ඇය ලද එකම දෙය මිහිරකි හැඟුම්බර

දෙන දෙන පහර උසුලන ලෙස මයින හමක්
එක වර යොදත හැකි සිත වැඩ ගොඩක ගමක්
හැම පැනයටම ඇති විසඳුම ලෙසට යමක්
තැබූ පය නැවත නොගනියි ඇය නැතිව ඉමක්

කෙදිනක වුවද ඇගෙ මෙහෙවර හිලව් කර
තබනුව හැකි නොවේ ලංසුව නොයන් දුර
සම තැන එපා නිසි තැන ලඟ ගිමන් හැර
අඩු කරගන්න ඉඩ දිය යුතු කරින් බර

මුදු යහගුණ කිරට පෙරා කුසගිනි නිව් අම්මා
සෙනෙහස බත් පිඩට අනා ගුලිකර කැව් අම්මා
නැළවිලි ගී ලෙසට අමා බුදු ගුණ කිව් අම්මා
ඇහේ තියන් දරුවො හදා දනට දුන්නු අම්මා

පුතේ කියා සෙනේහයෙන් ළඟට අරන් අම්මා
හිතේ බයක් නොදැනෙන්නට රැකවල දුන් අම්මා
වතේ පිපුණු සිනා මලෙන් ගෙය හැඩ කළ අම්මා
මෙතේ බුදුන්ටත් කලියෙන් නිවන් දකින් අම්මා

කරුණාව සහ පරාර්ථකාමිත්වය මගින් අප රට වෙනස් කළ හැකිද?

අපි ජීවත් වන්නේ බොහෝ බෙදීම් හා දුක් වේදනා සමඟ ය. ජාතිය, ආගම්, කුලය, පාසල, පොහොසත්, දුප්පත්, මහලු සහ තරුණ, ඔබ උපන් නගරය පක්ෂ දේශපාලන ආදී වශයෙන් අපි බෙදිලා.

වඩා දයානුකම්පිත කරුණාවන්ත ලාංකික ජනතාවක් ප්‍රාර්ථනා කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. වෙනසට බලපාන දයානුකම්පාව හිතාමතා භේදයක් නොමැතිව එදිනෙදා භාවිතයෙන් දුක් වේදනා සමනය කර , අපට ලෝකය සුව කළ හැකිය.

දයානුකම්පාව පුරුදු කිරීම ශාරීරික ව්‍යායාම සහ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් තරම් සෞඛ්‍යයට වැදගත් බව විද්‍යාත්මකව ද වටහාගෙන ඇත.

කරුණාව මෛත්‍රිය සහ පරාර්ථකාමිත්වය දහම් පාසලේ පමණක් සාකච්ඡා කොට ඒ පිළිබඳ විභාගයකට උත්තර දීමට සලස්සන මාතෘකාවක් නොවේ

එය අද විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සංකීර්ණ ප්‍රශ්න වලට විසඳුමකි.

පිළිකාවක් මෙන් සමාජගත වී ඇති දූෂණය,ආකල්ප සහ සදාචාරාත්මක වටිනාකම් පිරිහීම, අධික තණ්හාව, රාජ්‍ය සේවයේ අඩපණ වීම, අධ්‍යාපනය කඩා වැටීම, වැඩිවෙමින් පවතින අපරාධ, ආර්ථිකය කඩා වැටීම, මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ඇබ්බැහි වීම, සෞඛ්‍ය සේවයේ බිඳවැටීම..

අප රටේ ධනවතුන් සහ දුප්පතුන් අතර පරතරය ඉතා වැඩිවෙමින් පවතී. මේ සියල්ල කරුණාව සහ පරාර්ථකාමිත්වය මුල්තැන ගැන රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමෙන් විසඳිය හැකි බව අද විද්‍යාත්මකවත් තහවුරු වී ඇත.

කරුණාව සහ පරාර්ථකාමී බව නිතර භාවිතයේ දී පවුලේ ද, පාසලේ ද , සමාජයේ ද , රැකියා කරන ආයතනයේ ද විශාල වෙනසක් වෙන බව විද්‍යාත්මකව ද තහවුරු වී ඇත. එය සමාජයේ විශාල යහපතට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

වෘත්තීයවේදීන්, දෙමාපියන්, විශ්‍රාමිකයින් සහ ජීවිතයේ සෑම තරාතිරමකම රටේ වෙනසක් කරන්න උත්සහ ගන්නා නායකයින් ප්‍රායෝගික අනුකම්පා පුහුණුව සඳහා සහභාගි විය යුතුය.

දලයි ලාමා ලෝක ප්‍රකට මනෝවිද්‍යාඥ ඩැනියෙල් ගෝල්මන්ගෙන් ඉල්ලා සිටියේ වඩා හොඳ ලෝකයක් සඳහා වූ ඔහුගේ දැක්ම සහ විද්‍යාවට ඉටු කළ හැකි කාර්යභාරය පිළිබඳ පොතක් ලිවීමට.

ඔවුන්ගේ සහයෝගීතාවයේ ප්‍රතිඵලය වූයේ,A Force for Good: The Dalai Lama's Vision for Our World, නමින් පොතක් ප්‍රකාශ කිරීමයි. (දලයි ලාමාගේ ලෝකය සඳහා දැක්ම මෙන්ම ක්‍රියාවට ආරාධනාවක් වේ.)

ලෝක ප්‍රකට මනෝවිද්‍යාඥ ඩැනියෙල් ගෝල්මන්ගෙන් ඉල්ලා සිටියේ වඩා හොඳ ලෝකයක් සඳහා වූ ඔහුගේ දැක්ම සහ විද්‍යාවට ඉටු කළ හැකි කාර්යභාරය පිළිබඳ පොතක් ලිවීමට.

ඔවුන්ගේ සහයෝගීතාවයේ ප්‍රතිඵලය වූයේ,A Force for Good: The Dalai Lama's Vision for Our World, නමින් පොතක් ප්‍රකාශ කිරීමයි. (දලයි ලාමාගේ ලෝකය සඳහා දැක්ම මෙන්ම ක්‍රියාවට ආරාධනාවක් වේ.)

ඔහු කතා කරන්නේ බෞද්ධ දෘෂ්ටිකෝණයකින් නොවේ. ඔහු ඇත්තටම කතා කරන්නේ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින්. ඔහු Stanford, Emory සහ Wisconsin විශ්ව විද්‍යාලය වැනි ස්ථාන වලින් එන විද්‍යාත්මක සාක්ෂි භාවිතා කරයි-එසේම, Max Planck ආයතනයේ Tanya Singer ගේ පර්යේෂණ - මිනිසුන්ට මෛත්‍රිය වර්ධනය කිරීමේ හැකියාව ඇති බව පෙන්නුම් කරයි.

මෙම පර්යේෂණය ඉතා දිරිගන්වන සුළුය, මන්ද යත් විද්‍යාඥයින් විසින් මොළ සංකල්පනා භාවිතා කරන්නේ අනුකම්පාව පාලනය කරන විශේෂිත මොළයේ පරිපථ හඳුනා ගැනීම සඳහා පමණක් නොව, මෛත්‍රී කරුණා ක්‍රියා වලින් ස්නායු පරිපථ ශක්තිමත් වන බවත්, මිනිසුන් වඩාත් පරාර්ථකාමී බවට පත් වන බවත්, ඔවුන්කරුණාව ප්‍රායෝගිකව වර්ධනය වන විට, අනෙක් පුද්ගලයින්ට උපකාර කිරීමට කැමති බවත් පෙන්වන බැවිනි.

කරුණාව හා මෛත්‍රිය වර්ධනය කිරීමට සම්ප්‍රදායික මෛත්‍රී කරුණා වැඩි භාවනා ඉතාම සුදුසු යයි විද්‍යාත්මකව තහවුරු වී ඇත. මෙය ඉතා දිරිගන්වන සුළුය, මන්ද එය අපගේ සදාචාර සුක්කානම ලෙස අපට අනුකම්පාව අවශ්‍ය වන මූලික අවශ්‍යතාවයකි.

කරුණාව සහ මෛත්‍රිය දියුණු කිරීමෙන් මානසික සහ කායික සෞඛ්‍යය, අන් අය සමග හොඳ සම්බන්ධතා ගොඩනැගීමට ද , ආත්ම අභිමානය වැඩි කළ හැකි බව ද පර්යේෂණ මගින් තහවුරු කර ඇත.

කරුණාව සහ මෛත්‍රිය සහජයෙන්ම ඇති වන අතර, එය ඉගෙන ගැනීමටද පුළුවන ඒ වගේම දියුණු කළ ද හැකිය.

එබැවින් අපගේ සංකීර්ණ ජාතික, සමාජීය සහ පවුල් ප්‍රශ්න විසඳීම සඳහා සැමට කරුණාව සහ මෛත්‍රිය පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම වැදගත් වේ.මෙම සංකීර්ණ, විශාල හා තීරණාත්මක ගැටලු ප්‍රතිපත්ති, ක්‍රියාවලීන් සහ නීතියෙන් පමණක් විසඳිය නොහැක.

ඉංජිනේරු ලලිත් ද සිල්වා
සභාපති
විද්‍යාලංකාර සභාව

දුරුතු පොහොයේ වැදගත්කම

- බුදු රදුන්ගේ ප්‍රථම ලංකාගමනය.
- බුද්ධත්වයෙන් නව මසකට පසු උරුවෙල් දනව්වට වැඩමකළ බුදුරදුන් උරුවෙල කාශ්‍යප,නදී කාශ්‍යප,ගයා කාශ්‍යප යන තුන්බෑජටිලයන් ප්‍රමුඛ 1000 පිරිස සිය දහම් මගට හරවා ගැනීම.
- ලක් දිව ත්‍රිපිටක බුද්ධ ධර්මය ප්‍රථම වරට පුස්තකාරූඩ කිරීම.

දුරුතු පොහෝ දිනය

දුරුතු පුර පසළොස්වක පොහොය දිනය සෑම වසරකම පළමු මස යෙදෙන අති උතුම් පොහෝ දිනයයි.බුද්ධත්වයෙන් 09වන මස දුරුතු පුර පසළොස්වක පොහෝ දිනක බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදුවීම ඇතුළු ජාතික,ආගමික හා සංස්කෘතික මෙන්ම ඓතිහාසික කාරණා රැසක් හේතුවෙන් මෙම දුරුතු පොහොය අපට ඉතා වැදගත් වේ.

බුදුරදුන් බරණැස ඉසිපතනාරාමයේ පළමු වස් කාලය ගත කළසේක.පළමු රහතන් වහන්සේ හැටනම දහම් පණිවිඩය ලොව පුරා පැතිරවීමට,ගම්දනව් කරා පිටත් කර උරුවෙල් දනව්වට වැඩම කළහ.උරුවෙල් කාශ්‍යප,නදී කාශ්‍යප,ගයා කාශ්‍යප ඇතුළු දහසක් පිරිසට දම් දෙසා කුරු රටට පිඬු සිඟා වැඩිසේක.

අනවතත්ත විල් තෙරදී දන් වළඳ සමවත් සුවයෙන් වැඩසිට බුදු ඇසින් ලොවදෙස බලන කල ලක්දිව යක්ෂ ගෝත්‍රිකයන් හා නාග ගෝත්‍රිකයන් සටනකට සූදානම් වන බව දුටු සේක.පසුව මහියංගනය නම් ප්‍රදේශයට වැඩම කොට ඍද්ධි ප්‍රාතිහාර්ය පාමින් දහම් දෙසා එම ආරවුල සමථයකට පත් කළහ.

දහම් ඇසීමට රැස්වූ පිරිස අතර සිටි සමන්ත කූට පර්වතවාසී සුමන සමන් දෙවියෝ සෝවාන් ඵලයට පත්වූහ.වන්දනාමාන කිරීමට යම් පූජා වස්තුවක් ඉල්ලා සිටි හෙයින් බුදුන් වහන්සේ හිස අතගා කේෂධාතු මිටක් පරිත්‍යාග කළහ.සුමන සමන් දෙවියෝ එම කේෂධාතු රන් කරඬුවකින් පිළිගෙන පත්කඩ එළා බුදුන් වහන්සේ දම්දෙසූ ස්ථානයේ සත්රියන් උස විසිරියන් වට ඉන්ද්‍රනීලමය සායක් කරවීය.බුදුන් වහන්සේ ජීවමාන කාලයේදීම ලොව බිහිවූ මුල්ම චෛත්‍ය මහියංගන චෛත්‍ය බව ඉතිහාසයේ දැක්වෙයි. බුදුන් වහන්සේ පිරිණිවන් පෑ පසු මහ රහතන් වහන්සේලා බුදුන් වහන්සේගේ ග්‍රීවා ධාතුව රහසේ ලබාගෙන ලංකාවට පැමිණ මහියංගන සෑයේ තැන්පත්කොට මේස වර්ණ පාෂාණයෙන් දොළොස් රියන් උස සෑයක් සෑදවීය.වර්ෂ දෙදහස් පන්සියයකටත් පෙර සිදු වූ මෙම චෛත්‍ය කර්මාන්තය ලොව රහතන්වහන්සේ නමක් නිමකල එකම චෛත්‍ය ලෙසද සැලකේ.

වර්තමානය වන විට දුරුතු පෝය මංගල්‍යය කැළණිය කේන්ද්‍රකොටගෙන සිදුවන්නේ කැළණි විහාරය මගින් පවත්වනු ලබන දුරුතු පෙරහැර මංගල්‍යය නිසාවෙනි.දුරුතු පොහොය දිනය බෞද්ධ පෙරහැර සංස්කෘතියේ ආරම්භය ලෙසද සලකනු ලබයි.

බොදු සමුළු පුවත්

බොදු මහ සමුළුවට 103ක් සපිරීම නිමිත්තෙන් පැවැත්වෙන පිංකම් මාලාව

සෑම වසරකම සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයෙහි ඡන්ම දිනය හා ආදී කර්තෘවරුන් සැමරීම නිමිත්තෙන් පැවැත්වෙන සර්ව රාත්‍රික පිරිත් පින්කම කොළඹ 07 ශ්‍රී සම්බෝධි විහාරාධිපති බෞද්ධයා මාධ්‍ය ජාලයේ ගරු සභාපති පූජ්‍ය බොරලන්දේ වජිරඤාණ නායක ස්වාමින්වහන්සේගේ සහභාගීත්වයෙන් 2022.12.18 පැවැත් වූ අතර පසු දින අනුනායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ වෙත උදෑසන සපිරිකර සාංඝික දානමය පින්කමක් පැවැත් විය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් සංවිධානය කරනු ලබන ලේ දන්දීමේ පින්කම 2022 දෙසැම්බර් මස 18 වන ඉරු දින නාරාහේන්පිට ලේ බැංකු පරිශ්‍රයේදී පැවැත්විණ.

මැලේසියාවේ ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේ විහාරාධිපති පූජ්‍ය බූටෑවත්තේ සරණංකර නායක ස්වාමින්ද්‍රයන්වහන්සේ විසින් බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා වෙත පරිත්‍යාග කරන ලද රන් ආලේපිත බුදු පිළිම වහන්සේ ස්ථාවර ආසනයක තැන්පත් කිරීම සහ ධාතු නිධන් කිරීම 2022.12.18 වන දින සවස 7.00 ට යෙදුන සුභ මොහොතින් සම්මේලනයේ සාමාජික භවතුන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරින.